සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

| 33 | S | I |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020
Second Term Test - Grade 12 - 2020

විභාග අංකය .............................

# ගිණුම්කරණය I

කාලය පැය දෙකයි

**උපදෙස්**

- අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමි වේ.
- විභාග අංකය ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

| ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

1. ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ,
   1. ආයතනයක් පිළිබඳ තොරතුරු එහි තොරතුරු භාවිත කරන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා සැපයීමය.
   2. ආයතනයක ගණුදෙනු හා සිද්ධීන් මූල්‍ය තොරතුරුවලට පරිවර්තනය කිරීමය.
   3. ආයතනයක සැලසුම් කිරීම සහ පාලනය සඳහා කළමනාකරුවන්ට තොරතුරු සැපයීමය.
   4. ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති තොරතුරු විශ්ලේෂණය කිරීමයි.
   5. ආයතනයක ගණුදෙනු හා සිද්ධීන් ගිණුම්පොත්වල වාර්තා කිරීමය. (…..)

2 ''වත්මන් රජය මගින් භාණ්ඩ හා සේවා සඳහා පනවා තිබූ එකතු කළ අගය මත බදු (VAT) අනුපාතිකය පහළ දැමීම'' යන සිද්ධිය වඩාත් අදාල වන්නේ කවර ගිණුම්කරණ පරිසරයටද?

1. සමාජ හා සංස්කෘතික පරිසරය
2. ආර්ථික හා දේශපාලන පරිසරය
3. නෛතික පරිසරය
4. ශිල්පීය හා වෘත්තීය පරිසරය
5. තාක්ෂණික පරිසරය (…..)

3 ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ පහත කාර්යවල නිවැරදි අනුපිළිවෙල කුමක් ද?

A - ලෙජරයට ගනුදෙනු පිටපත් කිරීම
B - ව්‍යාපාර ගනුදෙනු සිදුවීම
C - මූලාශ්‍ර ලේඛන සකස් කිරීම
D - මූලික සටහන් පොත්වල වාර්තා කිරීම
E - ශේෂ පිරික්සුම පිළියෙල කිරීම

1. A,B,C,D,E  2. B,C,D,A,E  3. C,A,B,D,E  4. D,A,B,C,E  5. E,A,B,C,D (…..)

4. ව්‍යාපාරයක අයිතිකරු විසින් තම පෞද්ගලික මුදලින් රු. 3000 ක පොලියක් සහිතව රු. 15,000 ක ණය වාරිකයක් ගෙවන ලදී. මෙම ගණුදෙනුව හිමිකමට සහ වගකීම්වලට කරන බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි දක්වනුයේ,

| | හිමිකම | වගකීම් |
|---|---|---|
| 1. | රු. 15,000 කින් අඩුවේ | රු. 15,000 කින් අඩුවේ |
| 2. | රු. 12,000 කින් අඩුවේ | රු. 12,000 කින් අඩුවේ |
| 3. | රු. 12,000 කින් වැඩිවේ | රු. 12,000 කින් අඩුවේ |
| 4. | රු. 15,000 කින් වැඩිවේ | රු. 15,000 කින් අඩුවේ |
| 5. | රු. 12,000 කින් අඩුවේ | රු. 12,000 කින් වැඩිවේ |

(…..)

5. පහත ගණුදෙනු අතුරින් අයිතිකරුගේ හිමිකමට බලපෑමක් ඇති කරන ගණුදෙනුව වන්නේ,
1. ණයගැතියන්ගෙන් මුදල් ලැබීම
2. ණය හිමියන්ට මුදල් ගෙවීම
3. විකුණූ භාණ්ඩ ආපසු එවීම
4. අත්පිට මුදලට ලීබඩු උපකරණ ගැනීම
5. බැංකු ණයක් ලබා ගැනීම (…..)

6. යම් ගණුදෙනුවක් නිසා ''වත්කම් = හිමිකම + වගකීම්'' යන ගිණුම්කරණ සමීකරණය කෙරෙහි ඇති කරන නිවැරදි බලපෑමක් නොවන්නේ,
1. වත්කම් වැඩිවීම, හිමිකම් අඩුවීම
2. වත්කම් වැඩිවීම, හිමිකම වැඩිවීම
3. වත්කම් අඩුවීම, වගකීම් අඩුවීම
4. වත්කම් වැඩිවීම, වත්කම් අඩුවීම
5. වගකීම් වැඩිවීම, වගකීම් අඩුවීම (…..)

7. ව්‍යාපාරයක ලාභය ගණනය කිරීම සඳහා යොදා ගත හැකි සමීකරණය වන්නේ,

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | ආරම්භක ශුද්ධ වත්කම් | - | අවසාන ශුද්ධ වත්කම් | - | ගැනිලි | + | අතිරේක ප්‍රාග්ධනය |
| 2. | ආරම්භක ශුද්ධ වත්කම් | - | අවසාන ශුද්ධ වත්කම් | + | ගැනිලි | - | අතිරේක ප්‍රාග්ධනය |
| 3. | අවසාන ශුද්ධ වත්කම් | + | ආරම්භක ශුද්ධ වත්කම් | - | ගැනිලි | - | අතිරේක ප්‍රාග්ධනය |
| 4. | අවසාන ශුද්ධ වත්කම් | - | ආරම්භක ශුද්ධ වත්කම් | - | ගැනිලි | + | අතිරේක ප්‍රාග්ධනය |
| 5. | අවසාන ශුද්ධ වත්කම් | - | ආරම්භක ශුද්ධ වත්කම් | + | ගැනිලි | - | අතිරේක ප්‍රාග්ධනය |

(…..)

8. ආයතනයක් විසින් ලකුණු කළ මිල රු. 600,000 ක් වූ භාණ්ඩ 5% ක වෙළඳ වට්ටමකට යටත්ව ණයට මිලදී ගෙන පසුව රු. 650,000 ක අත්පිට මුදලට විකුණන ලදී. ණයහිමියන්ට ගෙවිය යුතු මුදල මේ දක්වා පියවා නොමැත. මෙම ගණුදනෙුවල **ශුද්ධ බලපෑම** ගිණුම්කරණ සමීකරණයේ නිරූපණය කරනුයේ,

| | වත්කම් | හිමිකම් | වගකීම් |
|---|---|---|---|
| 1. | රු. 50,000 කින් වැඩිවේ | රු. 50,000 කින් වැඩිවේ | - |
| 2. | රු. 80,000 කින් වැඩිවේ | රු. 80,000 කින් වැඩිවේ | - |
| 3. | රු. 80,000 කින් වැඩිවේ | රු. 650,000 කින් වැඩිවේ | රු. 570,000 කින් අඩුවේ |
| 4. | රු. 650,000 කින් වැඩිවේ | රු. 80,000 කින් වැඩිවේ | රු. 570,000 කින් වැඩිවේ |
| 5. | රු. 650,000 කින් වැඩිවේ | රු. 50,000 කින් වැඩිවේ | රු. 600,000 කින් වැඩිවේ |

(…..)

- **ප්‍රශ්න අංක 9,10 සහ 11 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2020.01.01 දින මුදලින් රු. 500,000 ක් ආයෝජනය කරමින් අශාන් විසින් වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලද අතර, 2020 ජනවාරි මාසයේ දී පහත ගනුදෙනු සිදුවිය.

| දිනය | විස්තරය |
|---|---|
| 2020.01.10 | - හිරුෂ ව්‍යාපාරයෙන් රු. 300,000 ක භාණ්ඩ ණයට මිලදී ගන්නා ලදී. |
| 2020.01.12 | - හිරුෂ ව්‍යාපාරයෙන් මිලදී ගත් රු. 20,000 ක භාණ්ඩ ආපසු යවන ලදී. |
| 2020.01.15 | - රු. 100,000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 300,000 කට ප්‍රතීත් ට අත්පිට මුදලට විකුණන ලදී. |
| 2020.01.24 | - රු. 10,000 ක වට්ටමකට යටත්ව හිරුෂ ව්‍යාපාරයට ගෙවිය යුතු මුදල පියවන ලදී. |

9. හිරුෂ ව්‍යාපාරය සමඟ සිදුකළ ඉහත ගණුදෙනු ඒවා සිදුවූ අනුපිළිවෙල අනුව අශාන්ගේ ව්‍යාපාරයේ පොත්වල සටහන් කිරීමට භාවිත කළ මූලාශ්‍ර ලේඛන වන්නේ,
1. ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වවුචරය
2. ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුරය
3. ඉන්වොයිසිය, ජ'නල් වවුචරය, ගෙවීම් වවුරය
4. ඉන්වොයිසිය, හරපත, ලදුපත, ගෙවීම් වවුරය
5. ඉන්වොයිසිය, බැරපත, ලදුපත, ජ'නල් වවුරය (…..)

10. අශාන්ගේ ව්‍යාපාරයේ 2020.01.12 සිට 2020.01.24 දක්වා සිදුවූ ගණුදෙනු සටහන් කිරීමට භාවිත කළ මූලික සටහන් පොත් අනුපිළිවෙලින් වන්නේ,
1. ආපසු යැවුම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය හා මුදල් ගෙවීම් ජ'නලයයි.
2. ආපසු යැවුම් ජ'නලය, විකුණුම් ජ'නලය හා මුදල් ගෙවීම් ජ'නලයයි.
3. පොදු ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය හා මුදල් ගෙවීම් ජ'නලය
4. ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය හා මුදල් ගෙවීම් ජ'නලයයි.
5. ගැනුම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය හා මුදල් ගෙවීම් ජ'නලයයි. (…..)

11. අශාන්ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසය සඳහා ලාභය සහ 2020.01.31 දිනට මුදල් ශේෂය කොපමණ ද?

| | **වර්ෂය සඳහා ලාභය (රු.'000)** | **මුදල් ශේෂය (රු.'000)** |
|---|---|---|
| 1. | 200 | 190 |
| 2. | 200 | 530 |
| 3. | 210 | 190 |
| 4. | 210 | 530 |
| 5 | 210 | 680 |

(.....)

12. පහත සුළු මුදල් ගණුදෙනු පිළිබඳ තොරතුරු ''විශ්මි'' ව්‍යාපාරයෙන් උපුටා ගන්නා ලදී.
- 2020.01.01 දිනට සුළු මුදල් ශේෂය රු. 1450
- 2020.01.01 දිනට අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා රු. 8550
- 2020.01.31 දිනට සුළු මුදල් ශේෂය රු. 1900
- සෑම මාසයකම පළමු දින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කරනු ලැබේ.
- 2020 පෙබරවාරි මස සිට අග්‍රිමය තවත් රු. 5000 කින් ඉහළ දමන ලදී

2020 ජනවාරි මාසයේ සුළු මුදල් වියදම හා පෙබරවාරි 01 දින ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල කොපමණද?

| | **ජනවාරි මස සුළු මුදල් වියදම (රු.)** | **පෙබරවාරි 01 දින ප්‍රතිපූර්ණය කරන මුදල (රු.)** |
|---|---|---|
| 1. | 8,100 | 13,100 |
| 2. | 8,100 | 15,000 |
| 3. | 8,150 | 13,100 |
| 4. | 8,150 | 15,000 |
| 5 | 10,000 | 15,000 |

(.....)

- **පහත තොරතුරු ඇසුරින් 13 සහ 14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සීමිත නඳුන් සමාගමේ 2019.03.31 දිනෙන් ගිණුම් වර්ෂය අවසාන වේ. 2019.03.01 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය හා මුදල් ගිණුමේ ශේෂය සමාන වුවත්, 2019.03.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වූ රු. 120,000 මුදල් ගිණුමේ ශේෂය සමග අසමාන විය. මෙම ශේෂ දෙක අතර වෙනසට හේතු සෙවීමේ දී පහත සඳහන් කරුණු අනාවරණය විය.
- නිකුත් කළ, ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම රු. 50,000 යි.
- තැන්පත් කළ උපලබ්ධි නොවූ චෙක්පත්වල වටිනාකම රු. 30,000 යි.
- බැංකුව විසින් අයකළ බැංකු ගාස්තු රු. 3,000 යි.
- තැන්පත් කළ, අගරු වූ චෙක්පත්වල වටිනාකම රු. 10,000 යි.

13. 2019.03.31 දිනට මුදල් ගිණුමේ පැවති ශේෂය
1. රු. 100,000 කි 2. රු. 113,000 කි 3. රු. 127,000 කි. 4. රු. 130,000 කි. 5. රු. 140,000 කි (.....)

14. 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දැක්විය යුතු මුදල් ශේෂය,
1. රු. 97,000 කි 2. රු. 100,000 කි 3. රු. 114,000 කි. 4. රු. 117,000 කි. 5. රු. 127,000 කි (.....)

15. සීමිත පැතුම් පොදු සමාගමේ 2019.03.31 දිනට ශේෂ පිරික්සුම සමාන නොවීය. පසුව කරන ලද ගිණුම් පරීක්ෂාවේ දී පහත දෑ හෙළිදරව් විය.
   - කාර්යාල උපකරණ මිලට ගැනුම් රු. 100,000 ක් මුදල් ගෙවීම් ජ'නලයේ සටහන් කර, මුදල් ගිණුමට පමණක් බැර කර තිබුණි.
   - විකුණුම් ජ'නලය රු. 40,000 ක් වැඩියෙන් එකතු කර තිබුණි.
   - දුන් වට්ටම් රු. 6000 ක් , ලද වට්ටම් ගිණුමට බැර කර තිබුණි.
   - ණයට ගැනුම් රු. 26,000 ක භාණ්ඩ, ජ'නලයේ නිවැරදිව ලියා, අදාල ණය හිමියාගේ ගිණුමේ රු. 62,000 ක් ලෙස වාර්තා කර ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය වන්නේ,

1. රු. 58,500 හර 2. රු. 58,500 බැර 3. රු. 72,000 හර
4. රු. 112,000 බැර 5. රු. 112,000 හර (.....)

16. සයුරු ව්‍යාපාරය 2019.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම සමාන නොවීය. එය නොසළකා හැර ශුද්ධ ලාභය ගණනය කර ඇති අතර පසුව, සිදු වූ පහත වැරදි සොයා ගන්නා ලදී.

- රු. 120,000 ක ණයට ගැණුම්, ණය හිමි පාලන ගිණුමට පමණක් බැර කර ඇත.
- රු. 20,000 ක ලද වට්ටම්, දුන් වට්ටම් ගිණුමට හර කර ඇත.
- ආරම්භක තොගය ශේෂ පිරික්සුමට උපුටා ගැනීමේදී රු. 10,000 ක් වැඩියෙන් උපුටා ගෙන ඇත.

ඉහත වැරදි නිසා ගණනය කර ඇති ශුද්ධ ලාභයට සිදුවී ඇති බලපෑම වන්නේ,

1. රු. 40,000 කින් අධිතක්සේරු වී ඇත
2. රු. 50,000 කින් අධිතක්සේරු වී ඇත
2. රු. 70,000 කින් අධිතක්සේරු වී ඇත
4. රු. 80,000 කින් අවතක්සේරු වී ඇත
5. රු. 100,000 කින් අවතක්සේරු වී ඇත (…..)

17. පහත සඳහන් වැරදි අතුරින් ශුද්ධ ලාභයට බලපෑමක් ඇති නොකරන වරද වන්නේ,

1. මුදල් ලැබීම් ජ'නලයේ දුන් වට්ටම් තීරුව රු. 2000 ක් අඩුවෙන් ගෙන තිබීම
2. අත්පිට විකුණුම් රු. 25,000 ක් මුදල් ලැබීම් ජ'නලයේ හා විකුණුම් ගිණුමේ රු. 52,000 ක් ලෙස සටහන් කිරීම.
3. ලෙජරයේ ගැණුම් ගිණුම තුලනය කිරීමේදී රු. 5000 ක් වැඩියෙන් ගෙන තිබීම.
4. ගැනිලි ගිණුමේ රු. 75000 ක ශේෂය ශේෂ පිරික්සුමට ගෙන ගොස් නැත.
5. ගමන් වියදම් වශයෙන් ගෙවූ රු. 600 ක් ලිපිද්‍රව්‍ය වියදම් ගිණුමට රු. 6000 ක් ලෙස හර කිරීම. (…..)

18. සීමිත තරිඳු සමාගමේ 2020.01.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 400,000 ක් වූ අතර, එය එදිනට පිළියෙල කළ ණයගැති ලෙජරයේ ශේෂ ලේඛනයේ එකතුව සමඟ සමාන නොවීය. ශේෂ අසමාන වීමට බලපෑ හේතු පහත පරිදි විය.

- රු. 80,000 ක ණයට විකුණුම් ණයගැති ලෙජරය තුළ වාර්තා කර නොමැත.
- ආපසු එවුම් ජ'නලය එකතු කිරීමේදී රු. 10,000 ක් අඩුවෙන් එකතු කර ඇත.
- රු. 10,000 ක බොල් ණය කපා හැරීම පොදු ලෙජරය තුළ වාර්තා කර නොමැත.

2020.01.31 දිනට ණයගැති ශේෂ ලේඛනයේ පැවති එකතුව කොපමණද?

1. රු. 300,000 කි 2. රු. 320,000 කි 3. රු. 340,000 කි. 4. රු. 460,000 කි. 5. රු. 500,000 කි (…..)

19. 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමක් සම්බන්ධයෙන් පහත තොරතුරු දී ඇත.

| | (රු.) |
|---|---|
| ණයට ගැණුම් | 780,000 |
| ලද වට්ටම් | 85,000 |
| ආපසු යැවුම් | 35,000 |
| වර්ෂය තුල දී ණය හිමි ශේෂය අඩුවීම | 80,000 |

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය හිමියන්ට ගෙවන ලද මුදල කොපමණ ද?

1. රු. 580,000 කි 2. රු. 660,000 කි 3. රු. 695,000 කි
4. රු. 715,000 කි 5. රු. 740000 කි (…..)

20. පහත කුමන ප්‍රකාශය ආයතනයක ගිණුම්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිවැරදි වේද?

1. සුළු මුදල් ගෙවීම් ජ'නලය පොදු ලෙජරයේ ගිණුමක් ලෙස ද භාවිත කරයි.
2. වෙළඳ භාණ්ඩ ණයට විකුණුම් හා බැඳී සාරාංශගත තොරතුරු ණයගැති පාලන ගිණුමේ සටහන් කරයි.
3. සියළු මූලික ලියවිලි එහි ගණකාධිකාරීවරයා විසින් පිළියෙල කරයි.
4. ණය පදනම මත මිලදී ගත් සියළු වත්කම් සටහන් කිරීම සඳහා ගැණුම් ජ'නලය භාවිත කරයි.
5. ශේෂ පිරික්සුම තුලනය වීම එහි ගිණුම්කරණ ක්‍රියාවලියේ නිවැරදිතාව තහවුරු කරයි. (…..)

21 වසරකට වඩා භාවිතයට ගතහැකිවුවත් සුළු උපකරණ වල පිරිවැය ඒවා මිලදී ගත් වර්ෂය තුලදී සම්පූර්ණයෙන්ම ලාභාලාභ ගිණුමට කපා හරිනු ලබයි. මෙම ගිණුම්කරණ පිළිවෙත කුමන ගිණුම්කරණ සංකල්පයකට අනුකූලවේ ද?

1. ආරක්ෂණ 2. ගැලපුම් 3. කාලච්ඡේද 4. ප්‍රමාණාත්මක 5. උපචිත (…..)

22. ව්‍යාපාරයක අයිතිකරු විසින් කරනු ලබන ගැනිලි ගිණුම්ගත කිරීමේදී පදනම් කර ගන්නා ගිණුම්කරණ සංකල්පය කුමක්ද?

1. ඒකක 2. ගැලපුම් 3. උපචිත 4. මූල්‍ය මිනුම් 5.අඛණ්ඩ පැවැත්ම (…..)

23. වෙළඳ ව්‍යාපාරයක විකිණීමට ඇති භාණ්ඩ තොගය ජංගම වත්කම් ලෙසත්, මෝටර් රථ ජංගම නොවන වත්කම් ලෙසත් වර්ගීකරණය කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීමට පදනම් වන සංකල්පය කුමක්ද?

1. ඒකක 2. ගැලපුම් 3. උපචිත 4. උපලබ්ධි 5. අඛණ්ඩ පැවැත්ම (…..)

24. විකුණූ භාණ්ඩවල පිරිවැය වියදමක් ලෙසත්, ඉතිරි තොගය වත්කමක් ලෙසත් හඳුනා ගැනීම වඩාත් හොඳින් විස්තර කරනුයේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?

1. ආරක්ෂණ 2. අඛණ්ඩ පැවැත්ම 3. ගැලපුම් 4. ඓතිහාසික පිරිවැය 5. උපලබ්ධි (…..)

25. දේපල, පිරියත හා උපකරණ ක්ෂය වෙන් කිරීම සඳහා පදනම සපයන ගිණුම්කරණ සංකල්පය කුමක් ද?

1. එතිහාසික පිරිවැය 2. අඛණ්ඩ පැවැත්ම 3. උපලබ්ධි 4. උපචිත 5. යථාරූපී (…..)

26. මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් සහ ණය හිමියන් හඳුනා ගැනීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්පය පදනම් වන්නේද?

1. ඒකක 2. උපචිත 3. කාලච්ඡේද 4. ගැලපුම් 5. උපලබ්ධි (…..)

27. 2019.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ඉසුරුගේ ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු හා ගිණුම් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| - විදුලිය වියදම - | වර්ෂය තුළ ගෙවීම් | 60,000 |
| | 2019.01.01 දිනට ගෙවිය යුතු | 15,000 |
| | 20119.12.31 දිනට ගෙවිය යුතු | 25,000 |
| - ආයෝජන ආදායම්- | වර්ෂය තුළ ලැබීම් | 30,000 |
| | 2019.01.01 දිනට ලැබිය යුතු | 3000 |
| | 2019.12.31 දිනට කලින් ලද | 7000 |

ඉහත ගනුදෙනු නිසා 2019 වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත යුතු විදුලිය වියදම හා ආයෝජන ආදායම කොපමණද?

| | **විදුලිය වියදම (රු.)** | **ආයෝජන ආදායම (රු.)** |
|---|---|---|
| 1. | 50,000 | 40,000 |
| 2. | 70,000 | 40,000 |
| 3. | 70,000 | 20,000 |
| 4. | 100,000 | 26,000 |
| 5 | 100,000 | 34,000 |

(…..)

28. පහත තොරතුරු සඳීපා වෙළඳ ව්‍යාපාරයට අදාල වේ.

| | **(රු.'000)** |
|---|---|
| 2019.01.01 දිනට තොගය | 360 |
| ගැණුම් | 840 |
| ගෙන ඒමේ කුලී | 40 |
| විකුණුම් | 1400 |

මෙම ව්‍යාපාරයේ 2019.12.31 දින ඇති වූ ගින්නකින් තිබූ බඩු තොගය සම්පූර්ණයෙන්ම විනාශ විය. ව්‍යාපාරයේ දළ ලාභ අනුපාතිකය විකුණුම් මත 25% කි.

ගින්නෙන් හානි වූ තොගයේ පිරිවැය කොපමණද?

1. රු. 150,000 කි. 2. රු. 170,000 කි. 3. රු. 190,000 කි.
4. රු. 200,000 කි. 5. රු. 240,000 කි. (…..)

29. අනුරගේ ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය සකස් කිරීමේදී වැරදීමකින් අවසාන බඩු තොගයේ වටිනාකම අවතක්සේරු වී ඇත. ආදායම් ප්‍රකාශනයේ පහත අයිතමයන්ට වන බලපෑම වන්නේ,

| | | | |
|---|---|---|---|
| 1. | විකුණුම් පිරිවැය අඩුවේ | - | වර්ෂයේ ලාභය අඩුවේ. |
| 2. | විකුණුම් පිරිවැය වැඩිවේ | - | වර්ෂයේ ලාභය වෙනස් නොවේ. |
| 3. | විකුණුම් පිරිවැය වෙනස් නොවේ | - | වර්ෂයේ ලාභය වැඩිවේ. |
| 4. | විකුනුම් පිරිවැය වැඩිවේ. | - | වර්ෂයේ ලාභය අඩුවේ. |
| 5 | විකුණුම් පිරිවැය අඩුවේ | - | වර්ෂයේ ලාභය වෙනස් නොවේ. |

(…..)

30. පහත තොරතුරු මධුෂාන් ව්‍යාපාරයට අදාල වේ.

| | (රු.) |
|---|---|
| 2018.04.01 දිනට තොගය | 300,000 |
| 2018.04.01 දිනට වෙළඳ ගෙවිය යුතු දෑ | 200,000 |
| 2019.03.31 දිනට තොගය | 400,000 |
| 2019.03.31 දිනට වෙළඳ ගෙවිය යුතු දෑ | 250,000 |

2019.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ ණය හිමියන්ට රු. 1350,000 ක් ගෙවූ අතර, අත්පිට ගැණුම් රු. 1100,000 ක් විය. ව්‍යාපාරය පිරිවැයට 25% ක ලාභාන්තිකයක් සහිතව මිල ලකුණු කරයි.

2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ විකුණුම් වටිනාකම කොපමණ ද?

1. රු. 1,250,000 කි. 2. රු. 1,625,000 කි. 3. රු. 3,000,000 කි.
4. රු. 2,250,000 කි. 5. රු. 2,750,000 කි. (…..)

- **ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි හා නිශ්චිත පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

31. ආයතනයක කළමනාකරණ ගිනුම්කරණයේ කාර්යභාරයට අදාලව පහත ප්‍රකාශවල **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න.

| | **ප්‍රකාශය** | **සත්‍යයයි /අසත්‍යයි** |
|---|---|---|
| A- | එය කළමනාකරුවන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සපයයි. | ....................................... |
| B- | එය මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සපයයි. | ....................................... |
| C- | එය ආයතනයක් පිළිබඳ අතීත තොරතුරු පමණක් සපයයි. | ....................................... |
| D- | එය තොරතුරු සැපයීම සඳහා ගිණුම්කරණ ප්‍රමිත, සංකල්ප යොදා ගනියි. | ....................................... |

32. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න සඳහන් කරන්න.

| | **ප්‍රකාශය** | **සත්‍යයයි /අසත්‍යයි** |
|---|---|---|
| A | ගිණුම්කරණ අනුපාත මත ආයතනයක ලාභදායිත්වය විශ්ලේෂණය කිරීම මූල්‍ය ගිණුම්කරණයේ කාර්යකි. | ....................................... |
| B | ව්‍යාපාරයක අතීත මෙන්ම අනාගත තොරතුරු භාවිත කිරීම කළමනාකරණ ගිණුම්කරණයේ කාර්යභාරයකි. | ....................................... |
| C | ආයතනයක මුදලින් මැනිය හැකි ගණුදෙනු පමණක් ගිණුම්පොත්වල සටහන් කරන්න. | ....................................... |
| D | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල නොකරයි. | ....................................... |

33. පහත මූලික සටහන් පොත්වලට අදාල මූලාශ්‍ර ලේඛන සඳහන් කරන්න.

| | මූලික සටහන් පොත | මූලාශ්‍ර ලේඛනය |
|---|---|---|
| A | මුදල් ලැබීම් ජර්නලය | ............................................................ |
| B | ආපසු යැවුම් ජර්නලය | ............................................................ |
| C | සුළු මුදල් ගෙවීම් ජර්නලය | ............................................................ |
| D | පොදු ජර්නලය | ............................................................ |

34. පහත අවස්ථාවලදී වඩාත් අදාළ වන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

| | අවස්ථාව | ගිණුම්කරන සංකල්පය |
|---|---|---|
| A | ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු හා සිද්ධීන් අතුරින් මුදලින් මැනිය හැකි ගනුදෙනු හා සිද්ධි පමණක් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කිරීම. | ...................................... |
| B | ගෙවිය යුතු වියදම් හා වැඩිපුර ගෙවා ඇති වියදම් මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කිරීම. | ...................................... |
| C | දේපල, පිරියත හා උපකරණ ප්‍රථම වරට හඳුනා ගැනීමේදී පිරිවැයට වාර්තා කිරීම. | ...................................... |
| D | සමාගමක අධ්‍යක්ෂවරයෙකුට දුන් ණය මුදල් කොතෙක් කුඩා ප්‍රමාණයක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල වෙනම අනාවරණය කළ යුතු වීම. | ...................................... |

35. එකතුකළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි ආයතනයක් 8% ක VAT සහිතව රු. 432,000 ක භාණ්ඩ ණයට විකුණන ලදී.

මෙම ගනුදෙනුව ගිණුම්ගත කිරීමට අදාල ජර්නල් සටහන පෙන්වන්න.

..............................................................................................................................................................

..............................................................................................................................................................

..............................................................................................................................................................

36. පහත ගිණුම්, මූල්‍ය ප්‍රකාශන මූලිකාංග යටතේ වර්ග කර දක්වන්න.

| | ගිණුම | වර්ගීකරණය |
|---|---|---|
| A | ලී බඩු සමුච්චිත ක්ෂය ගිණුම | ............................................................ |
| B | ගැනිලි ගිණුම | ............................................................ |
| C | ආපසු එවුම් ගිණුම | ............................................................ |
| D | සේවක වන්දි සඳහා වෙන්කිරිමේ ගිණුම | ............................................................ |

37. ශ්‍යාමලීගේ ව්‍යාපාරයේ 2019.01.01 දිනට සහ 2019.12.31 දිනට මුළු වත්කම් පිළිවෙලින් රු. 300,000 ක් හා රු.600,000 ක් විය. ආරම්භක වගකීම් වලට වඩා අවසාන වගකීම් රු. 75,000 කින් අඩුබව අයිතිකරු පවසයි. වර්ෂය තුලදී අයිතිකරු රු. 150,000 ක අමතර ප්‍රාග්ධනයක් යොදවා ඇති අතර, ඇයගේ පෞද්ගලික පරිහරණය සඳහා ව්‍යාපාරයෙන් රු. 30,000 ක් ලබාගෙන ඇත. ව්‍යාපාරයේ 2019.01.01 දිනට වගකීම් රු. 150,000 ක් විය.

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය කොපමණද?

..........................................................................................................................................................

38. ව්‍යාපාරයක 2020.03.01 දින සුළු මුදල් භාරකරු සතු අත ඉතිරි මුදල රු. 1250 කි. එදින ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට ලබා දී ඇති මුදල රු. 6750 කි.

1. මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය කොපමණද?

…………………………………………………………………………………………………………

2. 2020 පෙබවාරි මාසයේ සුළු මුදල් වියදම කොපමණද?

…………………………………………………………………………………………………………

39. මුදල් ගිණුමේ ශේෂය සමග බැංකු ප්‍රකාශයේ ශේෂය සංසන්දනය කිරීමේ දී මුදල් ගිණුමේ වාර්තා කිරීමට සිදුවන අයිතම හතරක් සඳහන් කරන්න.

1. ……………………………………………………………………………………………………

2. ……………………………………………………………………………………………………

3. ……………………………………………………………………………………………………

4. ……………………………………………………………………………………………………

40. චමත් ගේ ව්‍යාපාරයේ 2019.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 100,000 කි. එදිනට අඩමාන ණය සඳහා 10% ක් වෙන්කළ යුතුවේ. මෙම තොරතුරු සැලකිල්ලට ගනිමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | **අවස්ථාව** | **ගැලපුම් කිරීමට අදාල ද්විත්ව සටහන (විවරණය සමඟ)** |
|---|---|---|
| A- | ප්‍රථම වතාවට අඩමාන ණය වෙන් කිරීම. | ........................................................ |
| B- | 2018.04.01 දිනට අඩමාන ණය වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු. 8000 ක් පවතී නම්, | ........................................................ |

41. ලසිත් ව්‍යාපාරයේ 2018.04.01 දිනට පැවති **ගොඩනැගිලි** වලට අදාල තොරතුරු පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| පිරිවැය | 800,000 |
| සමුච්චිත ක්ෂය | 160,000 |
| වාර්ෂික ක්ෂය අනුපාතය | 10% |

ඉහත තොරතුරු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| **වාර්ෂික ක්ෂය ප්‍රමාණය (රු.)** | **ඵලදායී ජීව කාලය (වර්ෂ)** | **2019.03.31 දිනට සමුච්චිත ක්ෂය (රු.)** | **2019.03.31 දිනට ධාරණ අගය (රු.)** |
|---|---|---|---|
| ...................................... | ...................................... | ...................................... | ...................................... |

42. ණයගැති පාලන ගිණුමේ ශේෂය එදිනට පිළියෙල කරන ලද ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුවට සමාන වුවද ගණුදෙනු වාර්තා කිරීමේදී වැරදි හා අත්හැරීම් සිදුවිය හැකිය. එසේ සිදුවිය හැකි වැරදි **දෙකක්** සඳහන් කරන්න.

1. ……………………………………………………………………………………………………..

2. ……………………………………………………………………………………………………..

43. සැසඳුම් ප්‍රකාශන පිළියෙල කරන අවස්ථා දෙකක් ලියන්න.

1. ……………………………………………………………………………………………………..

2. ……………………………………………………………………………………………………..

44 සනීර ව්‍යාපාරය 2019 වර්ෂය තුළ රක්ෂණ ගාස්තු වශයෙන් රු. 10,000 ක් ගෙවා ඇත. 2019.01.01 දිනට ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු රු. 2000 කි. තවද 2019.12.31 දිනට රක්ෂණ ගාස්තු ලෙස රු. 3000 ක් ගෙවිය යුතුව තිබේ.

1. 2019 වර්ෂයට අදාළ රක්ෂණ ගාස්තු වියදම කොපමණ ද?

……………………………………………………………………………………………………..

2. ඉහත ගණනය සඳහා අදාළ වූ ගිණුම්කරණ සංකල්ප දෙකක් සඳහන් කරන්න.

a) ……………………………………………………………………………………………

b) ……………………………………………………………………………………………

45. තනි පුද්ගල ව්‍යාපාරයකට අදාලව පහත ප්‍රකාශන **සත්‍යද, අසත්‍යද** යන්න සඳහන් කරන්න.

| | | **සත්‍යයි/අසත්‍යයි** |
|---|---|---|
| A- | ශුද්ධ වත්කම් ප්‍රවේශයෙන් ලාභය සෙවීමේදී ගැනිලි අඩුකළ යුතුයි | ................................................................ |
| B- | යොදන ලද ප්‍රාග්ධනය හා රඳවාගත් ඉපයුම්වල එකතු ව හිමිකමට සමාන වේ. | ................................................................ |
| C- | ගැනිලි ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා ගනී | ................................................................ |
| D- | ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී ගැලපුම් සංකල්පය යොදා ගනී. | ................................................................ |

46. ව්‍යාපාරයක පහත ගණුදෙනු නිසා එහි හිමිකම **වැඩිවේ, අඩුවේ** සහ **වෙනස් නොවේ** යන්න සඳහන් කරන්න.

| | | **වැඩිවේ/අඩුවේ/ වෙනස් නොවේ** |
|---|---|---|
| A- | රු. 5000 ක පොලිය ඇතුළුව රු. 50,000 ක බැංකු ණය වාරිකය ගෙවීම. | ................................................................ |
| B- | ව්‍යාපාරයේ රු. 20,000 ක ප්‍රචාරණ වියදම අයිතිකරු විසින් පෞද්ගලිකව ගෙවා දැමීම. | ................................................................ |
| C- | ණයහිමියෙකුට ණය ශේෂය පියවීමේදී රු. 2000 ක වට්ටමක් ලැබීම. | ................................................................ |
| D- | රු. 10,000 ක තොගයක් පුන්‍යායතනයකට පරිත්‍යාග කිරීම. | ................................................................ |

47. ආයතනයක් විසින් වත්කම් සම්බන්ධයෙන් ගිණුම් තැබීමේ දී ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් බැහැර වන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

1. ……………………………………………………………………………………………………..

2. ……………………………………………………………………………………………………..

48. 2019.03.31 දිනට අමිල ව්‍යාපාරයේ ගිණුම් පොත් වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | (රු.) |
|---|---|
| භෞතික තොගය (2019.03.31) | 150,000 |
| ණය ගැතියෝ | 130,000 |
| විකුණුම් | 860,000 |

විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත රු. 80,000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 120,000 කට ඉන්වොයිස් කර ගණුදෙනුකරුවකු වෙත යවා ඇත. ආපසු එවීමේ කාලය ඉක්ම නොවූ මෙම බඩු තොගයෙන් 50% ක් 2019.03.31 දින වන විට විකුණා ඇති බව අනාවරණය කරගෙන ඇත. තොග ගණුදෙනුකරුට යවන අවස්ථාවේ මුළු වටිනාකම ණයට විකුණුම් ලෙස පොත්වල වාර්තා කර ඇත.

පහත ගිණුම් ශේෂයන් ගණනය කරන්න.

1. 2019.03.31 දිනට තොගය ……………………..………………………………………………….............…..
2. 2019.03.31 දිනට ණයගැති වටිනාකම ……………………………………......…………………...............…..
3. විකුණුම් වටිනාකම …......................……………......…………………………………………….............…..

49. ව්‍යාපාරයක රු. 50,000 ක් වටිනා තොග හානි වූ අතර එයින් 60% ක් වන්දියක් ලෙස ගෙවීමට රක්ෂණ සමාගම එකඟ වී ඇත. මෙය වාර්තා කිරීමට අදාල ද්විත්ව සටහන (වටිනාකමද ඇතුළුව දක්වන්න.)

......……………………………………………......…………………………………………………….............…..

......……………………………………………......…………………………………………………….............…..

......……………………………………………......…………………………………………………….............…..

50. දිදුල ව්‍යාපාරයේ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අදාල වේ.

| | (රු.'000) |
|---|---|
| තොගය (2018.04.01 දිනට) | 500 |
| ගැණුම් | 2000 |
| ගෙන ඒමේ කුලී | 500 |
| තොගය (2019.03.31 දිනට) | 2000 |

ව්‍යාපාරයේ දළ ලාභ අනුපාතිකය පිරිවැයට 50% කි. පහත වටිනාකම් ගණනය කරන්න.

(1) විකුණුම් පිරිවැය - ..........................................................................................................

(2) විකුණුම් වටිනාකම - ..........................................................................................................

❋❋❋